# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/13 - 2016 අගෝස්තු මස 30 වැනි අඟහරුවාදා - 2016.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ අඹකොටේ වත්ත ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය ව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/1/1234.

*උපලේඛනය*

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 695 - අඹකොටේ ග්‍රාම නිලධාරී වසමේ අඹකොටේ වත්ත ගමේ පිහිටි අඹකොටේ වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 30 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | රත්නවෙල් හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | අතුරු මාර්ගය ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මහවැලි අධිකාරිය සතු ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : සොලමන් කුමාර රාජ් මහතා,<br>
අංක 3/6,<br>
අඹකොටේ,<br>
කෙන්ගල්ල.

09 - 588

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ කොඩ්ඩාඩි මලාපවහන පොම්පාගාර අංක 20 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1205.

#### උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/83, කොඩ්ඩාඩි ග්‍රාම නිලධාරී වසමේ කොඩ්ඩාඩි ගමේ පිහිටි යාපනය මහනගර සභාවට අයත් ඉඩමෙන් 6m x 4m ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ස්ටාර් පෙර පාසල් ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ස්ටාර් ප්‍රජා ක්‍රීඩාංගනය ; |
| *දකුණට* | : | රවි මහතා සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | කට්කුලම් පාරේ සිට ප්‍රවේශ මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. මහනගර සභාව,
යාපනය.

09 - 589

---

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ කොයියාතෝඩ්ඩම් මලාපවහන පොම්පාගාර අංක 5 (1) හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1191.

#### උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/66, එච්චමොඩායි ග්‍රාම නිලධාරී වසමේ කොයියාතෝඩ්ඩම් ගමේ පිහිටි පාල්කුලම් පොකුණ නැමති ඉඩමෙන් පර්චස් 18.66 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාල්කුලම් පොකුණ සහ පෙර පාසල් ඉඩම ; |
| *නැගෙනහිරට* | : | පාල්කුලම් පොකුණ සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | මහනගර සභා පෙර පාසල් ඉඩම ; |
| *බටහිරට* | : | පාල්කුලම් පොකුණ සහ අතුරු මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. මහනගර සභාව
යාපනය.

09 - 590

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.